**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය 2016 අප්‍රේල් 28 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**--------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

2014 සහ 2016 වර්ෂවලදී පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සභාවට ලැබී තිබුණු උපකරණ, රහිතව ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
**-----------------------------------**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.23,442,517 ක් වූ ලැබිය යුතු ගිණුම්වලින් රු.2,277,893 ක් වසර 01 ත් 03 ත් අතර සහ රු.2,004,768 ක් වසර 02 වැඩි කාලයක් හිඟව පැවතුණි.

(ආ) **<u>ගෙවිය යුතු ගිණුම්</u>**
සමාලෝචිත වර්ෂය අවසානයට රු.17,563,719 ක් වූ ගෙවිය යුතු ගිණුම්වලින් විශේෂ හේතු මත රඳවාගතයුතු ගාස්තුවක් හැර ඉතිරි වගකීම් ගෙවා දැමීමට කටයුතු කර නොතිබුණි.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
**--------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට වූ ගිණුම් අනුව එකතුව රු.1,485,231 ක් වූ ලීබඩු හා සවිකිරීම් සම්බන්ධයෙන් වන වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

**1.3.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රා දේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) | 5 (7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. |
| (ii) | 217 රීතිය | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර අංක.පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාර ලේඛනයක පවත්වාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 10 වන උප වගන්තිය | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව සභා ලේකම්වරයා නිවාඩු දින සේවයේ නිරත වී තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,751,497 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,393,978 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,357,519 ක වර්ධනය කෙරෙහි උත්පාදිත හා වෙනත් ආදායම් එකතුව රු.18,884,689 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

2015 වර්ෂයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර අනුපාතය 1.43:1 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ එය 1.52:1 ක් විය.

## 2.4 ආදායම් පරිපාලනය

---

### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

---

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුකරන ලද හිඟ ආදායමෙන් සියයට 85 ක ප්‍රමාණයක් එක්රැස්කරගෙන තිබූ අතර, 2015 වර්ෂයට වෙනත් ආදායම් වශයෙන් ඇස්තමේන්තු කරන ලද වටිනාකම සමාලෝචිත වර්ෂයේදී සියයට 76 කින් අඩුවී තිබුණි.

### 2.4.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---

වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.2,166,747 ක් වූ උසාවි දඩ අයවිය යුතුව තිබූ අතර, මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල නොකිරීම නිසා 2013 ජුනි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු.400,000 ක ඇස්තමේන්තුගත මුදලක් ගිණුම්ගත කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

වර්ෂය තුළ ප්‍රමාණවත් ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමක් හෝ නව ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි යොමුවීමක් සිදුකර නොතිබුණි.

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

නවගත්තේගම රංග ශාලා ගොඩනැඟිල්ල සභාවට පවරා ගැනීමේ අරමුණින් එම ගොඩනැඟිල්ලේ නවීකරණ කටයුතු වෙනුවෙන් රු.300,204 ක් සභාව විසින් වැයකර තිබුණද, ප්‍රාදේශීය ලේකම් විසින් එම පවරාදීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---

(අ) සභා බලප්‍රදේශය තුළ දෛනිකව එකතුකරන කසළ විවෘත ඉඩමකට බැහැර කිරීම හේතුවෙන් පරිසර හානියක් සිදුවිය හැකි තත්ත්වයක් උද්ගතව තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ඉඩමක් අත්පත් කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් රු.1,776,351 ක ප්‍රතිපාදිත මුදල් ආපසු යැවීමට සිදුවී තිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

---

වර්ෂ ගණනාවක සිට සභාවේ ලේකම්, පුස්තකාලයාධිපති, වැඩ පරිපාලක, නල ළිං කාර්මික සහ විදුලි කාර්මික යන තනතුරු දිගින් දිගටම පුරප්පාඩුව පැවතුණි.

## 3.5 නිෂ්කාර්ය වත්කම්

---

එකතුව රු.575,000 ක් වටිනා මිනි කුබෝටා ට්‍රැක්ටරය සමඟ ටේලරයක්, යතුරු පැදියක් සහ ජල බවුසරයක් වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

---

## 4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

2016 වර්ෂය සඳහා සභාව විසින් එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ අඩුපාඩු වරින් වර මාගේ විගණන විමසුම් මඟින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. | උපයෝගී ලේඛනවල ඇති ඇතැම් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |
| | | ii. | ස්ථාවර වත්කම් ලේඛනය සහ වැය ලෙජරය වැනි ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ආ) | ආදායම් පාලනය | i. | ප්‍රාදේශීය සභාව නව ආදායම් මාර්ග උත්පාදනය සම්බන්ධව අවධානය යොමු කර නොතිබුණි. |
| | | ii. | මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් වැනි ආදායම් රැස්කිරීමේ ප්‍රමාදයන් දක්නට ලැබුණි. |
| (ඇ) | ගබඩා | | ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | කසළ කළමනාකරණය | | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් වන කසළ පරිසර හිතකාමී ලෙස අපහරණය කිරීමට කටයුතු නොකිරීම. |